**අධ්‍යාපන අමාත්‍යාංශය - දකුණු පළාත**

**දකුණු පළාත් සහා <u>දෙමළ මාධ්‍ය</u> පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2025**

දකුණු පළාත් සහා දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දකුණු පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

දෙමළ මාධ්‍ය පාසල් වල ගුරු පුරප්පාඩු සඳහා දකුණු පළාත තුල ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති වුවහොත් දකුණු පළාත තුලින් සම්පූර්ණ කල නොහැකි පුරප්පාඩු සඳහා ජාතික මට්ටමින් මෙම බඳවා ගැනීම සිදු කරන අතර පවතින ප්‍රතිපාදන හා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගන්නා සංඛ්‍යාව තිරණය කරනු ලැබේ. ඉදිරියේ දී බඳවා ගැනීම් සම්බන්ධයෙන් ලැබෙන අනුමැතීන්ට යටත්ව 2025.03.05 දින වන තෙක් පවත්නා පුරප්පාඩු සඳහා මෙම විභාගය වලංගු වේ.

**1. වැටුප් ක්‍රමය :**

**i. 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට අදාළව**

මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(iv) හි ජී-ඊ-1-2016 - ඒ දරණ වැටුප් ඛණ්ඩයට අදාළ රු.31,490 – 6x445 – 7x525 – 2x600 - රු.39,035/- වේ.ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු.37,835/- වැටුප් තලයේ පිහිටවනු ලැබේ.

**2. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

2.1. අධ්‍යාපන සුදුසුකම් :

i. ඉගැන්වීම් කාර්යයක් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන 01 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතුය.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මව්බස (දෙමළ) සමත්ව තිබිය යුතුය.)

***ඉතා වැදගත් :*** (අයදුම් පත්‍රය සම්පූර්ණ කිරිමේ දී සැලකිල්ලට ගත යුතුය.)

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතුය.
- උපාධියට හදාරා ඇති විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය.
- ඉල්ලුම් කළ හැක්කේ විෂයයන් **තුනක්** සඳහා පමණි.
- ඉල්ලුම් කළ විෂයය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

3.2 කායික හා මානසික යෝග්‍යතාවය -

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරී ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 වයස

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම් -

I. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු හෝ කලත්‍රයා, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් දකුණු පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.(ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය. දකුණු පළාත තුල අදාළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හිදී පමණක් ජාතික මට්ටම සළකා බලනු ලැබේ.

IV. දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

3. **සේවා කොන්දේසි** :

I. රාජ්‍ය /පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය.මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.පත්වීම් ලබන පාසලෙහි අවම වශයෙන් වසර 5ක් වත් අනිවාර්යයෙන් සේවය කල යුතුය.

IV. 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

4. **බඳවා ගැනීම :**

4.1. බඳවා ගැනීමේ ක්‍රමය :

I. 2008.07.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. ඉදිරිපත් කර ඇති අයදුම්පත් අනුව සුදුසුකම් ලත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වන අවස්ථා වලදී තරඟ විභාගයක් නොපවත්වා සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් කුසලතා අනුපිළිවෙල මත බඳවාගැනීම සිදු කරන අතර සුදුසුකම්ලත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන අවස්ථාවක දී තරඟ විභාගයක් පවත්වා තරඟ විභාගයේ ලකුණු සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව, බඳවාගැනීම් කටයුතු සිදු කෙරේ.

4.2 ලිඛිත තරඟ විභාගය - මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| **විෂයය** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01යි) | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි) | 100 | 40 |

**විෂය නිර්දේශය** :

විෂය අංකය 01 - අභියෝග්‍යතා පරික්ෂණය

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිලිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

විෂය අංකය 02 - සාමාන්‍ය දැනීම

ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය

4.3 විභාග පටිපාටිය -

I. මෙම විභාගය දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.
II. සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ දෙමළ මාධ්‍යයෙනි. භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතුය.
III. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා වෙනස් කිරීමට පසුව අවසර දෙනු නොලැබේ.
IV. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතුය.
V. වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරීයා විසින් තීරණය කරනු ලැබේ.

4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

4.5ප්‍රායෝගික පරීක්ෂණය -

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණු හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| 06. | **මුළු ලකුණු ප්‍රමාණය** | **25** | **10** |

4.6 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය -

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි.(25).

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

4.7 නිර්ණායකයන්හි අරමුණු -

I. අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමේ අරමුණ පැහැදිලි කිරිම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

II. පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

III. සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී අදාල කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

IV. කාල කළමණාකරණය.
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව.

5. විභාග ගාස්තු :

සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී රු.600.00 ක මුදලක් ගෙවිය යුතු වේ. අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පවත්වන තරඟ විභාගය සඳහා විභාග ගාස්තු වශයෙන් රු.600.00ක මුදලක් ගෙවිය යුතුවේ.

I. අයදුම්කළ යුතු පිළිවෙල - සියලුම අයදුම්කරුවන් www.edumin.sp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා යොමු කිරීමෙන් (Submit) අනතුරුව අයදුම්පත්‍රය බාගත කිරීම සිදු කළ හැකිය. අයදුම්පත පිරවීමේදී යොමු කර ඇති උපලේඛන 01,02 උපයෝගී කර ගත යුතුය.

II. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මඟින් සකස් කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

III. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර බාගත කරගන්නා ලද අයදුම්පතෙහි දෘඩ පිටපතක් 2025.03.07 දිනට පෙර ලැබෙන සේ පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත යොමු කළ යුතුය

IV. අයදුම් කරනු ලබන විෂයය, විෂයන් පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

V. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

අයදුම්පතෙහි අත්සන සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිළධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරීවරයෙකු, රු.498,960/- ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරණ නිළධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලැකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු හෝ යන අයවලුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරීයෙකු මඟින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර, අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

VI. මාර්ගගත ක්‍රමය මඟින් (Online) අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - 2025.03.07

6. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

7. මෙම බඳවා ගැනීම සිදු කිරීම හෝ අදාළ අවස්ථාවල දී විභාගය පැවැත්වීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසන් තීරණය හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත සිදු කරනු ලැබේ.

8. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණ පවත්වන ආකාරය පිළිබඳව සඳහන් කරමින් නිවේදනයක් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය www.edumin.sp.gov.lk මඟින් පළ කරනු ඇත.

9. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත මාර්ගගතව යොමු කර ඇති අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ඇත. ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී පත්වීම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ පත්වීම අවලංගු කිරීමේ බලය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

11. පත්වීම් ලිපියේ සඳහන් ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුලත වැඩ භාරගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම් දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

12. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා සතුවන අතර කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවකින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ ඒ පිළිබඳ අවසන් තීරණ ගැනීමේ අයිතිය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවේ.

උපලේඛණය 01

පුරප්පාඩු පවතින විෂයයන් පහතින් දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම් කරනු ලබන විෂයය තෝරා ගත යුතු ය.

| *අනු අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 01 | ප්‍රාථමික | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ භාෂාව හෝ දෙමළ වාග් විද්‍යාව විෂයය විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී උපාධිය සුදුසුකම් ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම් ඕනෑම උපාධියක් පිළිබඳව සළකා බලනු ලැබේ. |
| 02 | ඉංග්‍රීසි | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉංග්‍රීසි භාෂාව ~~විෂයය~~ක් ලෙස හදාරා ඇති උපාධියක් හෝ ශාස්ත්‍රවේදී (ඉංග්‍රීසි) විශේෂ උපාධිය TESL (Teaching English as a Second Language) හෝ HND ඉංග්‍රීසි සමඟ ඕනෑම උපාධියක් |
| 03 | නැටුම් (දේශීය) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ *මාධ්‍යය* විෂයයක් වශයෙන් නර්තන විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී (නර්තනය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී උපාධිය |
| 04 | නැටුම් (භාරතීය) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ *මාධ්‍යය* විෂයයක් වශයෙන් භරත නාට්‍යයම් විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී (නර්තනය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී උපාධිය |
| 05 | සංගීතය(පෙරදිග) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ *මාධ්‍යය* විෂයයක් වශයෙන් පෙරදිග සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී (පෙරදිග සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී උපාධිය |
| 06 | සංගීතය (කර්ණාටක) | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ *මාධ්‍යය* විෂයයක් වශයෙන් කර්ණාටක සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී (කර්ණාටක සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී උපාධිය |
| 07 | නාට්‍ය හා රංඟ කලාව | නාට්‍ය හා රංග කලාව දෙමළ *මාධ්‍යය* විෂයය ලෙස හදාරා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 08 | චිත්‍ර | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ විෂයයක් වශයෙන් චිත්‍ර කලා විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (චිත්‍ර ) උපාධිය |

| | | |
|---|---|---|
| 09 | විද්‍යාව | ජීව විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 10 | ගණිතය | ශුද්ධ ගණිතය /ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය දෙමළ *මාධ්‍යය* විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 11 | භූගෝල විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ භූගෝල විද්‍යාව විෂයය දෙමළ *මාධ්‍යය* විෂයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 12 | පුරවැසි අධ්‍යයනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රජා පාලනය හා පුරවැසි අධ්‍යාපන විෂයය දෙමළ *මාධ්‍යය* විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය හෝ මානව විද්‍යාව (විශේෂ) උපාධිය |
| 13 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | වාණිජවේදී උපාධිය / වාණිජ විෂයය ධාරාවට අයත් විද්‍යාවේදී උපාධිය / වාණිජ විෂයය ධාරාවට අයත් කළමනාකරණවේදී උපාධිය /වාණිජ විෂයය ධාරාවට අයත් දෙමළ *මාධ්‍යය* ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 14 | දෙවන බස සිංහල | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල භාෂාව විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 15 | ගෘහ ආර්ථික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක දෙමළ *මාධ්‍යය* ගෘහ විද්‍යාව විෂය සඳහා උපාධිධරයකු වීම. |
| 16 | දෙමළ භාෂාව හා සාහිත්‍ය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ භාෂාව විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 17 | ඉතිහාසය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ *මාධ්‍යය* ඉතිහාසය / පුරාවිද්‍යාව විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 18 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී ( ශාරීරික අධ්‍යාපන) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 19 | ගිණුම්කරණය | ගිණුම්කරණය පිළිබඳ උපාධියක් හෝ ගිණුම්කරණය දෙමළ *මාධ්‍යය* විෂයයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 20 | ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර අධ්‍යයනය හෝ ව්‍යාපාර කළමනාකරණයට අදාළ විෂයක් දෙමළ *මාධ්‍යය* විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 21 | ආර්ථික විද්‍යාව | ආර්ථික විද්‍යාව පිළිබඳ දෙමළ *මාධ්‍යය* විශේෂ උපාධියක් හෝ ආර්ථික විද්‍යාව විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | තොරතුරු තාක්ෂණය උපාධිය හෝ හෝ තොරතුරු තාක්ෂණය විෂයක් ලෙස හැදෑරූ දෙමළ *මාධ්‍යය* උපාධියක් |

| | | |
|---|---|---|
| 23 | උපදේශනය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ උපදේශනය පිළබඳ දෙමළ *මාධ්‍යය* සාමාන්‍ය උපාධියක් හෝ විශේෂවේදී උපාධියක් |
| 24 | දේශපාලන විද්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රජා පාලනය හා දේශපාලන විද්‍යාව විෂයය දෙමළ *මාධ්‍යය* විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය හෝ මානව විද්‍යාව (විශේෂ) උපාධිය |
| 25 | හින්දු ශිෂ්ඨාචාරය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ හින්දු ශිෂ්ඨාචාරය දෙමළ *මාධ්‍යය* විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 26 | ඉස්ලාම් ශිෂ්ඨාචාරය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉස්ලාම් ශිෂ්ඨාචාරය දෙමළ *මාධ්‍යය* විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 27 | අරාබි | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ අරාබි භාෂාව විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 28 | ඉස්ලාම් ධර්මය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉස්ලාම් ධර්මය දෙමළ *මාධ්‍යය* විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 29 | කතෝලික ධර්මය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ කතෝලික ධර්මය දෙමළ *මාධ්‍යය* විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 30 | ක්‍රිස්තියානි ධර්මය | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ක්‍රිස්තියානි ධර්මය දෙමළ මාධ්‍යය විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 31 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 32 | සංචරණය හා ආගන්තුක සත්කාරය | ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 33 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |

ඒ.යූ.වේලාරත්න,
ලේකම්
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
දක්ෂිණපාය,
ලබුදූව.

## දකුණු පළාත් දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන පුරප්පාඩු ලේඛනය

| කලාපය | පාසල | ගණිතය | විද්‍යාව | ඉංග්‍රීසි | දෙමළ | ප්‍රාථමික | ඉතිහාසය | භූගෝල විද්‍යාව | පුරවැසි අධ්‍යාපනය | චිත්‍ර | නැටුම් | සංගීතය | නාට්‍ය හා රංග කලාව | දෙවන බස සිංහල | ක්‍රිස්තියානි ධර්මය | කතෝලික ධර්මය | ඉස්ලාම් ධර්මය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | අරාබි භාෂාව | සෞඛ්‍ය | ගෘහ ආර්ථික විද්‍යාව | ඉස්ලාම් ශිෂ්ටාචාරය | හින්දු ශිෂ්ටාචාරය | දේශපාලන විද්‍යාව | ගිණුම්කරණය | ව්‍යාපාර අධ්‍යයනය | ආර්ථික විද්‍යාව | උපදේශනය | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | සංවර්ධනය හා ආගන්තුක සත්කාරය | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | සංගීතය කර්ණාටක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හම්බන්තොට | හ/කිරින්ද මුස්ලිම් ම.වි. | 2 | 1 | 1 | | 2 | 1 | | 1 | 1 | | | | 1 | | | 1 | 1 | | 1 | | | | | | 1 | 1 | | | | | |
| | හ/ඉක්රා ප්‍රා.වි. | | | | | 2 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | හ/එම්.ආර්.කාසිම් මු.ක.වි. | | 1 | | 1 | 2 | | | | 1 | | | | | | | | | | | | | | | | | | | | | | |
| | හ/බඳගිරිය මු.ක.වි. | 1 | | | | 5 | 1 | 1 | 1 | | | 1 | | | | | 1 | 1 | 1 | | | | | | | | | | | | | |
| | හ/අල් අක්බර් මු.ම.වි. | | 1 | | | | | | | 1 | | | | | | | | 1 | | | | | | | | | | 1 | | | 1 | |
| තංගල්ල | හ/නලගම මු.ක.වි. | 1 | | 1 | 1 | 2 | 1 | 1 | | | | | | 1 | | | 1 | | | | | | | | | 1 | | | | | | |
| | හ/තංගල්ල ම.වි. | 1 | 1 | 1 | | 3 | | | | | | | | | | | 1 | | | | | | | | | | | | | | | |
| වලස්මුල්ල | හ/අල් අමීර් මු.ම.වි. | | | 1 | | 4 | | | | | | | | | | | | 1 | | | 1 | | | | 1 | | 1 | | | | | |
| මොරවක | මාර/බෙවර්ලි දෙ.ම.වි. | 1 | | 1 | 2 | 2 | 1 | 1 | 1 | 1 | | | | | | | 1 | 1 | | | | | 1 | 1 | | | 1 | | | | | |
| | මාර/එන්සල්වත්ත දෙ.ම.වි. | 1 | 1 | 1 | 2 | 2 | 1 | 1 | | 1 | 1 | | 1 | 1 | 1 | 1 | 1 | 1 | | 1 | | | | | | | | | | | | |
| | මාර/ශාන්ත මැතිව්ස් ද්වි භාෂා ම.වි. | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | | 1 | 1 | | | | | 1 | | | | | 1 | 1 | | 1 | 1 | | | | | |
| | මාර/හැන්ෆර්ඩ් දෙ.ම.වි. | 1 | 1 | | 1 | 1 | 1 | 1 | 1 | | 1 | 1 | 1 | 1 | 1 | | | 1 | | 1 | | | 1 | 1 | | | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| | මාර/අනින්කන්ද දෙ.ම.වි. | | 1 | | 1 | 3 | 1 | | | | 1 | | 1 | | | 1 | | 1 | | | | | 1 | 1 | | | 1 | | | | | |
| අකුරැස්ස | මාර/හුලංදාව දෙ.ම.වි. | | | | | | | | | | 1 | 1 | 1 | | | 1 | | 1 | | | | | | | | | | | | | | |
| | මාර/ගොඩපිටිය සදාත් මු.ම.වි. | | | | | | | | | | | | | | | | | | | | | 1 | | | | | | | | | | |
| | මාර/අන්නූර් මු.ම.වි. | | | | | | | | | | | | | | | | | | | 1 | | | | | | | | | | | | |
| | මාර/අස්සෆා මු.ම.වි. | | | | | | | | | | | | | | | | | | | 1 | | | | 1 | | | | | | | | |
| මුලටියන | මාර/අල් මීනා මු.ම.වි. | | | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ඇල්පිටිය | ගා/තුන්දූව මු.ම.වි. | | | 1 | 2 | 4 | 1 | | 1 | | | | | | | | 1 | 1 | | | | | | | | 1 | | | | | | |
| | ගා/රෂීක් ෆරීඩ් මු.ම.වි. | | | 1 | | | | | | 1 | | | | | | | 1 | | | 1 | | | | | | | | | | | | |
| | ගා/දිවිතුර දෙ.ම.වි. | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | | 1 | 1 | | | 1 | 1 | | | 1 | | 1 | | | 1 | 1 | | | | 1 | | | | 1 |
| | ගා/ඉගල්කන්ද දෙ.ක.වි. | | | | 1 | 1 | | | 1 | | | | | | | | | | | | | | 1 | | | | | | | | | |
| උඩුගම | ගා/තල්ගස්වල දෙ.ක.වි. | 1 | 1 | | 1 | 4 | 1 | | 1 | 1 | | | | | | | | 1 | | 1 | | | | | | | | | | | | |
| | ගා/සරස්වතී දෙ.ම.වි. | 1 | | | 2 | 4 | 1 | | | 1 | 1 | 1 | | | | | | 1 | | | | | 1 | 1 | | 1 | | | | | | |
| | ගා/හිර්බුර සුලෙයිමානියා ම.වි. | | | | | | | | | | | | | | | | | 1 | | | | | | | | | | | | | | |
| | ගා/උස්වතුන් හසනා ම.වි. | | | | | | | | | | | | | | | | | 1 | | 1 | | | | | | | | | | | | |
| අම්බලන්ගොඩ | ගා/වැලිතර මු.ම.වි. | | 1 | | 1 | 2 | | | | 1 | | | | 1 | | | | 1 | 1 | | | | | 1 | 1 | | | | | | | |
| එකතුව | | 12 | 11 | 11 | 17 | 46 | 12 | 7 | 8 | 11 | 6 | 5 | 5 | 6 | 3 | 3 | 8 | 17 | 2 | 9 | 1 | 1 | 7 | 8 | 2 | 5 | 6 | 3 | 1 | 1 | 2 | 2 |